සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2017

### 7 - ශ්‍රේණිය

### සංගීතය

නම/විභාග අංකය :- ....................................................... කාලය: පැය 02යි.

## I පත්‍රය

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

(01) මන්ද සප්තකයේ ස්වර සම්බන්ධ නිවැරදි පිළිතුර තෝරන්න.

(1) ස්වරයට පහළින් තිතක් තබයි
(2) ස්වරයට උඩින් තිතක් තබයි
(3) ස්වරයට යටින් ඉරක් අඳියි
(4) ස්වරයට කිසිදු ලකුණක් නොයොදයි

(02) ස - රිස / රි - ගරි / ග - මග / ප - ප - යන ස්වර පාදය අනුව ගැයෙන ස්වර ස්ථාන ගී පාදය වන්නේ,

(1) බැතිනා සිරිපා කරුණා කරනා
(2) මුනිසිරි පාදේ සමනොළ මුදුනේ
(3) ඈත ඇඳි පළි මිණෙට පාවී
(4) කඳුපෙළ අතරේ තුරු වදුලේ

(03) සම්පූර්ණ ස්වර සප්තකයට අයත් ස්වර සංඛ්‍යාව කොපමණ ද?

(1) 2 යි
(2) 5 යි
(3) 7 යි
(4) 12 යි

(04) දාදරා තාලයේ මාත්‍රා සංඛ්‍යාව සහ විභාග කොටස් ගණන පිළිවෙළින් සඳහන් කර ඇති පිළිතුර සොයන්න.

(1) 6 - 2
(2) 2 - 6
(3) 6 - 3
(4) 3 - 6

(05) ලංකා s / ලංකා s / පෙම්බර / ලංකා s

මෙම ගීතය සම්බන්ධ නිවැරදි පිළිතුර වනුයේ.

(1) ගීතය සමග්‍රහයෙන් ආරම්භ වන අතර කෙහෙර්වා තාලය මත ගායනය කෙරේ.
(2) ගීතයේ මාත්‍රා බෙදී යන්නේ දාදරා තාලය මත වන අතර සමග්‍රහයෙන් ආරම්භ වේ.
(3) සමග්‍රහයෙන් ආරම්භවන ගීතය රූපක් තාලය අනුව ගායනය කෙරේ.
(4) විෂමග්‍රහයෙන් ආරම්භවන ගීතය දාදරා තාලය අනුව ගායනා කෙරේ.

(06) "පත්තානම් පල්ලි පන්න මල් ලුනුවිලේලෝ...." මෙසේ අරඹෙන ගීතය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වනුයේ.

(1) දැල් ගීතයකි - සාමූහික ගායනයකි
(2) දැල් ගීතයකි - ඒකලව ගයන්නකි
(3) කිවුළු බැති ගීයකි - සාමූහිකව ගයන්නකි
(4) කිවුළු බැති ගීයකි - ඒකලව ගයන්නකි

(07) "ස - රිරි / ග - - - / රි - ගග / ම - - - ," මෙම තාලානුකූල ස්වර පාදයට ගැළපෙන දෙවන ස්වර පාදය වනුයේ,

(1) ම - ගග / රි - - - / ග - රිරි / ස - - - (2) ග - මම / ප - - - / ම - පප / ධ - - -

(3) ධ - පප / ම - - - / ප - මම / ග - - - (4) ස් - නිනි / ධ - - - / ම - ගරි / ස - - -

(08) සුළුතනිගීත, මැදුම් තනිගීත, මහ තනිගීත යනුවෙන් නම් කෙරෙන්නේ,

(1) හින්දුස්ථානි තාලවේ (2) අපරදිග තාල වේ

(3) දෙගීතෙහි ප්‍රභේද වේ (4) තනිගීතෙහි ප්‍රභේද වේ

(09) විද්‍යුත් ස්වර පුවරු භාණ්ඩයක් වේ,

(1) මෙලෝඩිකාව (2) ජර්මිතාව

(3) මවුත් ඕගනය (4) සින්තසයිසරය

(10) සෑම ජාතියකටම පොදු වූ මෙම ගායනා තුළ ආදරය, කරුණාව ඇතුලත් වී ඇත. එම ගී වනුයේ,

(1) රබන් ගීතයි (2) දරුනැළවිලි ගීතයි

(3) නූර්ති ගීතයි (4) දැල් ගීතයි

- අංක 11 සිට 15 තෙක් ප්‍රශ්න වලට වරහන් තුළ ඇති පිළිතුරු වලින් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.

( නූර්ති, සෙබේ විදානේ, ළමා ගීතයක්, කෝලම් නාට්‍ය, උපදේශාත්මක ගී )

(11) කෝලම් රංගනයේදී චරිත වේදිකාවට හඳුන්වා දෙනු ලබන්නේ ........................................................ විසිනි.


(12) යහපත් දරුවෙකු සේ හැදෙන්නට අපට කියාදෙන ගී ........................................................ වේ.

(13) "මෙම ගිම්හාන ග්‍රීෂ්ම වූ කාලේ" යන ගීතය ........................................................ ගීතයකි.

(14) කටු අතුලේ මල් ඇහැරේ යනුවෙන් ගැයෙනුයේ ........................................................ වේ.

(15) පහතරට ප්‍රදේශයේ ප්‍රචලිත ජන නාට්‍ය විශේෂයක් ලෙස ........................................... හැඳින් වේ.

- අංක 16 සිට 20 තෙක් ප්‍රශ්න වලට අදාළව දී ඇති ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.




හරහට

(16) (1) ස්වර පුවරුව සහිත සුෂිර වාද්‍ය භාණ්ඩයකි.

(17) (4) ස්වර සප්තකයේ විකෘති ස්වර සංඛ්‍යාව

(18) (5) කණට මිහිරි වන්නේ.

පහළට

(19) (2) තත් 4කින් යුත් භාණ්ඩයකි

(20) (3) සරිගම, රිගම යන ස්වර රටාවේ පිහිටන ස්වර ඛණ්ඩයයි.

## II පත්‍රය

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

(01) (1) ස්වරපුවරුව සහිත භාණ්ඩ දෙකක් නම් කරන්න.

(2) "පොත පත ගියවා නුවණ ලබා" යන ගීතය වාදනයේදී යොදාගන්නා කෝමල ස්වර යුගලය ලියන්න.

(3) ඉහත සඳහන් ගී පාදය ගීත හා ස්වර ප්‍රස්තාර කරන්න.

(4) ඔබ විසින් ලියන ලද ප්‍රස්තාරයට ගැළපෙන තබ්ලා පදය ප්‍රස්තාර කරන්න.

(02) පහත සඳහන් A කොටසට ගැළපෙන පිළිතුරු B කොටසින් තෝරා යා කරන්න.

| A | B |
|---|---|
| (1) උඩු ගියරෙන් වැටී ගෙනේ | ත්‍රිවිධ ලය වේ |
| (2) විලම්බිත, මධ්‍ය, ද්‍රැත යනු | නූර්ති නාට්‍ය ගීතයකි |
| (3) කරුණාව සමග හොඳ සිත පතුරන්න හැම කෙරේ | දරු නැළවිලි ගීතයකි |
| (4) මන්ද්‍ර, මධ්‍ය, උච්ච | උපදේශාත්මක ගීතයකි |
| (5) අඹ දඹ නාරං කෙසෙල් දෙල් | ත්‍රිවිධ සප්තක වේ |

(03) පහත දැක්වෙන්නේ රංග සම්ප්‍රදායන් දෙකකට අයත් කරුණු කිහිපයකි.

a ගම්වල සැමතැන ඇවිද ගොසින්නේ

b දම්වැසි වස්සන ලෝකේ විදුර පනී

c පසතරට බෙරය භාවිතා කරයි

d ජෝන් ද සිල්වා මහතා නිෂ්පාදකවරයෙකි

e "රාමායනය" වෙස්සන්තර. දුටුගැමුණු" ආදී වශයෙන් බොහෝ නිර්මාණ ඇත

f වෙස් මුහුණු භාවිතා කරයි

(1) ඉහත තොරතුරු අනුව නියැවෙන සම්ප්‍රදායන් දෙක නම් කරන්න.

(2) ඔබ විසින් නම් කළ කොටස් දෙකට අදාළ කරුණු තෝරා වෙන් වෙන්ව ලියන්න.

(3) කැමති සම්ප්‍රදායකට අයත් ගීතයක මුල් කොටස ලියන්න.

(04) "ත ඳ පෙ / මී සි ට / පා s ය / ලා s s

මෙම පද පේළිය මාත්‍රා 03 බැගින් බෙදී ඇත.

(1) මෙම පද පෙළට ගැළපෙන රිද්ම රටාවක් ගොඩ නගන්න.

(2) ඔබ ඉහත නිර්මාණය කළ රිද්ම රටාව අනුවම ඉහත සැපයූ පද පෙළට ගැළපෙන තවත් පද පෙළක් ලියන්න.

(3) ඔබ ඉගෙන ගත් ළමා ගීතයක ස්ථායි (පළමු) කොටස ලියන්න.